“නුඹලා දැනුවත්වම අල්ලාහ්ට ආදේශයන් නොතබන්න.” යන උත්තරීතර අල්ලාහ්ගේ ප්රකාශය වනාහි. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා එම පාඨයේ සඳහන්: අල් අන්දාද් නම් අරාබි පදය රාත්රී අන්ධකාරයේ කළු මුඩු ගලක් මත කුහුඹුවා ගමන් කිරීමට වඩා සිහින්ව සිදුවන ආදේශ තැබීම යැයි අදහස් කර ඇත.

“නුඹලා දැනුවත්වම අල්ලාහ්ට ආදේශයන් නොතබන්න.” යන උත්තරීතර අල්ලාහ්ගේ ප්රකාශය වනාහි. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා එම පාඨයේ සඳහන්: ‘අන්දාද්’ නම් අරාබි පදය රාත්රී අන්ධකාරයේ කළු මුඩු ගලක් මත කුහුඹුවා ගමන් කිරීමට වඩා සිහින්ව සිදුවන ආදේශ තැබීම යැයි අදහස් කර ඇත. එය ‘අල්ලාහ් මතත් අහෝ මිනිස ඔබේ ජීවිතය හා මගේ ජීවිතය මතත් දිවුරා පවසමි’ යැයි පැවසීම, ‘මේ සුරතල් සුනඛයා නොසිටියේ නම් අප වෙත කොල්ලකරුවන් පැමිණෙන්නට තිබුණි. අප නිවසේ මේ තාරාවා නොසිටියේ නම්, කොල්ලකරුවන් අප වෙත පැමිණෙන්නට තිබුණි’ යනාදී ලෙස ඔබ පැවසීම, එමෙන්ම පුද්ගලයකු තම සගයාට: ‘අල්ලාහ් අභිමත කළ පරිදි හා ඔබ අභිමත කළ පරිදි සිදුව ඇත.’ යැයි පැවසීම, ‘අල්ලාහ්
හා ඒ පුද්ගලයා හැරෙන්නට’ යැයි මිනිසා පැවසීම යනාදියයි. එහිදී පුද්ගලයකු ඔබ පත් නොකළ යුතු වේ. මේ සියල්ල ආදේශ කිරීමයි.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු අබී හාතම් එය වාර්තා කර ඇත]

“නුඹලා දැනුවත්වම අල්ලාහ්ට ආදේශයන් නොතබන්න.” යැයි උත්තරීතර අල්ලාහ් ප්රකාශ කර ඇති අතර සැබැවින්ම මැවුම්කරු හා පෝෂක අල්ලාහ් පමණක් වන බවත් සැබැවින්ම තබන ලද ආදේශයන්ට කිසිදු කටයුත්තක් අයිති නොමැති බවත් ඔවුන් නොහැකියාවෙන් යුත් දිළිඳුන් බවත් මැනවින් දැන සිටියදී එවැනි දෑ ඔහුට සමානයන් හා ආදේශයන් ලෙස පත් කොට, ඔහු වෙනුවෙන් කරන නැමදුම්වල දී යමක් ඔවුන් වෙත යොමු කර සිටීම අල්ලාහ් මිනිසුනට තහනම් කළේය. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා ‘අන්දාද්’ නම් අරාබි පදය ‘ආදේශ තබනු ලබන්නන්’ යැයි හඳුන්වා දී ඇත. එය පිළිපදිමින් උදාහරණයක් ද මෙනෙහි කළේය. එනම් රාත්රී අන්ධකාරයේ කළු මුඩු ගලක් මත කුහුඹුවකු ගමන් කිරීමට වඩා එය සැහැල්ලුවෙන් බලපාන කරුණක් බවයි. පසුව ඒ සඳහා උදාහරණ මෙනෙහි කළේය. එනම් ඔබ අල්ලාහ් නොවන දෑට දිවුරා සිටීමයි. ඒ අතරින් වඩාත් බරපතල වනුයේ අල්ලාහ්ට සම තත්ත්වයේ එය තබා ‘අල්ලාහ් හා මාගේ ජීවිතය මත දිවුරමි’ යැයි ඔබ පැවසීම හෝ හේතුවට සාධක වූ දෑ අතහැර හේතුව වෙත අවධානය යොමු කිරීම හෝ අල්ලාහ් වෙනුවෙන් කටයුතු යොමු නොකර ‘අප ආරක්ෂා කරන මේ සුනඛයා නොහිටින්නට අප වෙත කොල්ලකරුවන් පැමිණෙනු ඇත’ යැයි පැවසීම හෝ ‘අප වෙත කිසියම් පිටස්තරයෙකු පිවිසුනේ නම් ඒ ගැන සැලකරන මෙම තාරාවා නිවසේ නොහිටින්නට එම කොල්ලකරුවන් එන්නට තිබුණි’ යැයි පැවසීමය. ආදේශ තැබීම අතරින් තවත් කරණක් වනුයේ මිනිසා තම සගයාට ‘අල්ලාහ් අභිමත කළ පරිදිත් ඔබ අභිමත කළ පරිදිත් සිදුවිය’ යැයි පැවසීම අල්ලාහ් හා මේ පුද්ගලයා නොහිටින්නට යැයි පැවසීමය. එහි දී කිසිදු පුද්ගලයකු පත් නොකළ යුතු වේ. පසුව ඒ සියල්ල සුළු ෂිර්ක්

ගණයට අයත් බව තරයේ ප්රකාශ කර සිටියහ. එසේ පවසන්නෙකු සැබැවින්ම අල්ලාහ්ගෙන් තොරව එම මිනිසා හෝ තාරාවා හෝ සුනඛයා විසින් බලපෑම් සිදුවන බව විශ්වාස කළේ නම් එය මහා ෂිර්ක් ගණයට අයත් වනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/3334